## ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ

20 වැනි සියවස ආරම්භ වන විට ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිය සැලකිය යුතු මට්ටමකට වර්ධනය වී තිබිණි. ඒ අතර ඉන්දියානු ජාතික ව්‍යාපාරය සීඝ්‍රයෙන් ඉදිරියට යමින් පැවතිණි. එය ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිකයන්ගේ උද්ඝෝෂණ ව්‍යාපාරයට බලපාන ලදී. එසේ ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් විදේශීය අධ්‍යාපනය ලබා පැමිණි අය තුළ ලිබරල්වාදී අදහස් පිළිබඳ අවබෝධයක් ඇතිවීම 20 වැනි සියවසේ මුල්භාගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය වර්ධනය වීමෙහිලා බලපෑවේ ය. තමන් ලද අධ්‍යාපනයට සාපේක්ෂව දේශපාලන, ආර්ථික, සමාජ ක්ෂේත්‍රයන්ට ඇතුළු වීමට අවස්ථාවක් ස්වදේශිකයන්ට ලැබුණේ නැත. ශ්‍රී ලාංකික මධ්‍යම පංතිකයන් දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉවත් කර තැබූ අතර ප්‍රතිසංස්කරණවල දී දේශපාලන කටයුතුවලට සහභාගී වීමට ඔවුන්ට හැකියාවක් නොවී ය. මේ හේතූන් නිසා ස්වදේශික මධ්‍යම පංතිකයන් තුළ බ්‍රිතාන්‍ය පාලනය කෙරෙහි දැඩි අප්‍රසාදයක් ඇති වෙමින් තිබිණි. එබැවින් 20 වැනි සියවසේ මුල් භාගයේදී දේශපාලන බලතල ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිය ජාතික ව්‍යාපාරයට එක් වන්නට පටන් ගත්හ.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබ බටහිර පන්නයට හැඩ ගැසුණ මධ්‍යම පංතියට දේශීය සභ්‍යත්වය යළි පණ ගැන්වීමට අවශ්‍ය නොවී ය. ඔවුන්ට අවශ්‍ය වූයේ අධිරාජ්‍යවාදී පාලකයන් විසින් ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රමය තුළ ප්‍රතිසංස්කරණ ලබා ගැනීම යි. ඔවුන්ගේ ප්‍රයත්නය වූයේ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ තුළින් රටේ පාලන කටයුතුවලට සම්බන්ධ වීමට තමන්ට අවස්ථාව ලබා ගැනීම යි. බ්‍රිතාන්‍ය පාලකයන් පලවා හැර රටවැසි සියලු දෙනාට නිදහස ලබාදීම ඔවුන්ගේ අපේක්ෂාව නොවී ය. ඒ අනුව 20 වැනි සියවසේ මුල් දශකය තුළ ඔවුහු ව්‍යවස්ථාදායක මණ්ඩලය පුළුල් කොට වැඩිපුර නියෝජිතයන් සංඛ්‍යාවක් එයට ඇතුළත් කොට ගැනීම සඳහා වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගැනීමේ උද්ඝෝෂණ ගෙන ගියහ. 1870 ගණන්වල ආරම්භ කළ පහතරට වැවිලිකරුවන්ගේ සංගමය එහි නායකත්වය දැරී ය. එසේ ම මේ කාලයේ ම ආරම්භ වූ යාපනය සංගමය, හලාවත සංගමය වැනි සංවිධාන ලංකා ජාතික සංවිධානය සමඟ එක් වී උද්ඝෝෂණ ගෙන ගියහ.

අධිරාජ්‍යවාදීන්ගෙන් නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දිනාගැනීම සඳහා ශ්‍රී ලාංකික නායකයෝ පෙත්සම් මාර්ගයෙන් සිය ඉල්ලීම ඉදිරිපත් කළහ. එච්. ජේ. සී. පෙරෙයිරා, ජේම්ස් පීරිස් වැනි අය ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව පුළුල් කිරීමට අමතරව සීමිත ඡන්ද බලය ලබාගැනීම ඇතුළු තවත් ඉල්ලීම් කිහිපයක් ම එමඟින් ඉදිරිපත් කළහ.

ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉතා ම වැදගත් අවධිය ලෙස දේශපාලන විචාරකයන් හඳුන්වන්නේ 1910 - 1920 අතර අවධිය යි. ජාතික ව්‍යාපාරය වඩා සංවිධානාත්මක තත්ත්වයට පත් වූයේ මේ කාලයේ ය. අප ඉහත පරිච්ඡේදයේ දී අධ්‍යයනය කළ පරිදි 1910 දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාදුන් නමුත් දේශීය නායකයෝ එයින් කිසිසේත් ම සෑහීමකට පත් නො වූහ. ඒ අනුව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගැනීම සඳහා සංවිධානාත්මකව කටයුතු කිරීමට යොමු කරනු ලැබුවේ මෙම යුගයේ නිසා දේශපාලනික වශයෙන් මේ කාලය ඉතා වැදගත් වේ.

මේ අවධියේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගැනීම සඳහා වූ ව්‍යාපාරය මුවහත් කිරීමට බලපෑ සාධක අතර 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය සහ 1919 පිහිටුවා ගත් ලංකා ජාතික සංගමය ප්‍රධාන විය.

## 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය

අධිරාජ්‍යවාදීන්ට විරුද්ධ ව ලාංකිකයන් වඩාත් සංවිධානය වීමෙහි ලා බලපෑ ප්‍රධාන සාධකය වුයේ 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය යි. 19 වන සියවසේ සිට ක්‍රියාත්මක වූ ජාතික පුනරුද ව්‍යාපාරය සහ ඊට ම සම්බන්ධ වූ අමද්‍යප ව්‍යාපාරය ද ඉතා ප්‍රබල ජාතික ව්‍යාපාර වුවත් ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිය අපේක්ෂා කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරයට ඒවායින් ලබාගත හැකි ව තිබූ පන්නරය ලබා ගැනීමට ඔවුහු ක්‍රියා නො කළහ. 1915 කෝලාහලයේ ආගමික ස්වරූපයක් දැකිය හැකි වුවත් එයට ආර්ථික හා දේශපාලන කරුණු රැසක් බලපා ඇති බව පෙනේ. පළමු වන ලෝක යුද්ධය නිසා සාමාන්‍ය ජනතාව ආර්ථික අතින් දැඩි පීඩනයකට පත්ව සිටියහ. රටේ විවිධ වෙළෙඳ කටයුතු අත්පත් කොට ගෙන සිටි මුස්ලිම් වෙළෙඳුන් කෙරෙහි දැඩි විරෝධතාවක් ද ගොඩ නැඟී තිබිණි. මේ තත්ත්වය යටතේ 1915 දී ගම්පොළ වලහගොඩ ප්‍රදේශයෙන් බෞද්ධ පෙරහැරක් ගිය අවස්ථාවේ ඇතිවූ ගැටුමක් මුල්කොටගෙන ආරම්භ වූ එම කෝලාහලය ශ්‍රී ලංකාවේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත විය.

මෙය අධිරාජ්‍ය විරෝධී අරගලයක් ලෙස විග්‍රහ කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුව යුද්ධ නීතිය පනවා එය දැඩි ලෙස මර්දනය කෙළේ ය. අමද්‍යප ව්‍යාපාරයෙහි නියුතු වූවන්ට විරුද්ධ ව ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට මාන බලමින් සිටි පාලකයන්ට මෙය කදිම අවස්ථාවක් විය. එම ව්‍යාපාරයේ නායකයන් අත් අඩංගුවට ගෙන කැරැළිකරුවන් ලෙස සලකා ඔවුන්ට දඬුවම් පැමිණවීමට කටයුතු කරන ලදි.

එෆ්. ආර්. සේනානායක, ඩී.එස්. සේනානායක, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, සී. බටුවන්තුඩාව, ඩී.ඒ. හේවාවිතාරණ, ඒ.ඊ. ගුණසිංහ වැනි අය මෙසේ සිරභාරයට ගත් අය අතර වූහ. විලියම් හෙන්රි පේද්‍රිස් ඇතුළු කීප දෙනෙක් කිසිදු නඩු විභාගයකින් තොරව මරා දමනු ලැබූහ.

මේ නිසා අධිරාජ්‍යවාදීන්ට එරෙහි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි දේශීය නායකයෝ අවධානය යොමු කළහ. එපරිද්දෙන් ගොඩ නැඟුණු ජාතික ප්‍රබෝධය නිසා අධිරාජ්‍යවාදීන්ට එරෙහි උද්ඝෝෂණ ව්‍යාපාර වඩාත් ශක්තිමත් ලෙස නැඟී එන්නට විය.

## 1919 ලංකා ජාතික සංගමය

බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව කටයුතු කිරීම නිසා නායකයන් අතර එකමුතුකම වර්ධනය වන්නට විය. බ්‍රිතාන්‍යයන් යටතේ සිදුවන අසාධාරණකම් සහ මර්දනවලින් මිදීම සඳහා සියලු ම ජනකොටස්වලින් සමන්විත බලවත් ජාතික සංවිධානයක අවශ්‍යතාව ශ්‍රී ලාංකික නායකයන්ට දැනෙන්නට විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දියානු ජාතික සංගමයේ ද ආභාෂය ලබා 1919 දී ලංකා ජාතික සංගමය පිහිටුවී ය. 1919 දක්වා ලාංකික මධ්‍යම පංතික නායකයන් විසින් ගෙනයන ලද දේශපාලන උද්ඝෝෂණ ව්‍යාපාරයේ වැදගත් ම ප්‍රතිඵලය ලෙස මෙය හැඳින්විය හැකි ය. පොන්නම්බලම් අරුණාචලම් මහතා මෙම සංගමයේ ප්‍රථම සභාපතිවරයා විය. ශ්‍රී ලාංකිකයන්ට පොදු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලීම් ඉදිරිපත් කිරීම මින්පසු ජාතික සංගමය මඟින් සිදු කෙරිණි. නිත්‍යානුකූලව හා සාමකාමී ව අයිතිවාසිකම් දිනා ගැනීම එම සංගමයේ සාමාජිකයන්ගේ අරමුණ විය.



රූපය 2.20
පොන්නම්බලම් අරුණාචලම් මහතා

1912 උගත් ලාංකිකයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායක සභාවට සාමාජිකයකු තෝරා පත්කොට ගැනීමේදී හෝ 1915 කෝලාහල ඇති වූ අවස්ථාවේ දී හෝ ජාතික සංගමය පිහිටුවාගත් අවස්ථාවේ දී හෝ කිසිදු ජන වර්ග භේදයකින් තොරව ජාතික නායකයෝ එකමුතුව කටයුතු කළහ. ජාතික සංගමයේ මෙහෙයවීම යටතේ ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ ක්‍රියාත්මක කළ අතර 1920, 1924, 1931 යන වර්ෂවලදී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් ලබා ගැනීමට ද ඔවුහු සමත් වූහ. එසේ වුවද ජාතික සංගමය බලාපොරොත්තු වූ අපේක්ෂාවන් ඒ මඟින් සම්පූර්ණයෙන් ඉටු නොවූ බව ද දිගින් දිගට ම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ කළ බව ද දක්නට ලැබේ.

ලංකා ජාතික සංගමය සියලු ජාතීන්ගේ එකමුතුවක් ලෙස ආරම්භ වුවත් 1921 වන විට සිංහල, දෙමළ කණ්ඩායම් දෙක අතර මත භේදයක් ඇති විය. ඒ හේතුකොට ජාතික සංගමයේ බලය දුර්වල වීම ද ආරම්භ විය. ව්‍යවස්ථාදායකය තුළ ආසන බෙදා ගැනීම සම්බන්ධයෙන් සිංහල සහ දෙමළ නායකයන් අතර ඇති වූ මත භේද හේතු කොට බස්නාහිර පළාතට වෙන් කළ අතිරේක ආසනය නිතරගයෙන් සුළු ජාතීන්ට ලබා දෙන බවට ඇතැම් නායකයන් අතර ඇති කොටගෙන තිබූ එකඟතාවය අමතක කිරීම වැනි ප්‍රධාන කරුණු කිහිපයක් නිසා දෙමළ නායකයන් තුළ සිංහල නායකයන් කෙරෙහි අවිශ්වාසයක් ගොඩ නැඟිණි. 1921 පමණ වන විට දෙමළ නායකයෝ බහුතරය පොන්නම්බලම් අරුණාචලම්ගේ ප්‍රධානත්වයෙන් ලංකා ජාතික සංගමයෙන් ඉවත් වූහ.

ලංකා ජාතික සංගමය ඇරඹුණේ විවිධ සංගම්වල නියෝජිතයන්ගෙනි. ඒ. ඊ. ගුණසිංහ මහතාගේ නායකත්වය යටතේ වූ ලංකා කම්කරු සංගමය ද එහි එක් නියෝජිතයෙක් විය. ලංකා කම්කරු සංගමයේ ප්‍රධාන ඉල්ලීම වූයේ "නිදහස" ය. ඔවුන් සර්වජන ඡන්ද බලය ඉල්ලා සිටිය ද ජාතික සංගම් නායකයෝ සීමිත ඡන්ද බලයක් පමණක් ප්‍රමාණවත් බව කියා සිටියහ. ඒ නිසා ඒ. ඊ. ගුණසිංහ මහතා ප්‍රධාන කම්කරු සංගමය ජාතික සංගමයෙන් ඉවත් වූහ. 1928 වන විට සුළු ජාතීන්, උඩරැටියන් මෙන්ම කම්කරු සංගමය ද ජාතික සංගමයෙන් ඉවත් වී සිටි අතර එහි ඉතිරි ව සිටියේ ප්‍රධාන වශයෙන් පහතරට වැවිලිකරුවන්ගෙන් සමන්විත නායකයන් පිරිසක් පමණි.

1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් ආණ්ඩුක්‍රමයක් නොලැබීම පිළිබඳව ලංකා ජාතික සංගමය තම කණගාටුව පළ කෙළේ ය. විධායක කාරක සභා ක්‍රමය සහ සර්ව ජන ඡන්ද බලය ද ලබා දුන් එම ප්‍රතිසංස්කරණ කෙරෙහි ඔවුහු අකමැත්ත පළ කළහ. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වන අතරතුර ලංකා ජාතික සංගමය හා තවත් සංවිධාන රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ හා ඉන් පිටත වඩාත් වගකීම් සහිත ආණ්ඩුවක් ලබා ගැනීම සඳහා කටයුතු කළහ.

මේ වන විට දෙවන ලෝක සංග්‍රාමය පෙරදිග ප්‍රදේශවලට පැතිරෙන්නට වීමත් යටත් විජිතවල උද්ඝෝෂණය වැඩි වන්නට වීමත් පිළිබඳ සලකා බැලූ බ්‍රිතාන්‍ය රජය 1943 දී ලංකාවට වගකිව යුතු ආණ්ඩුවක් දෙන බවට පොරොන්දු විය. ඒ අනුව පත්කළ සෝල්බරි කොමිසමේ නිර්දේශවලට අනුව සැකසුණු ආණ්ඩුක්‍රමයක් යටතේ 1948 පෙබරවාරි 04 වන දින ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කෙරිණි.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

- ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යභාරයන් ඉටුකළ ජාතික නායකයින් පිළිබඳ තොරතුරු රැස්කර කුඩා පොත් පිංචක් සකස් කරන්න.

## අධ්‍යාපනය

අනුරාධපුර යුගය ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රම පැවති බවට මූලාශ්‍ර ගත සාක්ෂි දක්නට ඇත. පන්සල් හා පිරිවෙන් ආයතන මුල් කොටගත් අධ්‍යාපන ක්‍රමයක් අතීතයේ සිට ම ලංකාවේ පැවතිණි. පෘතුගීසීන් හා ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් පසු ඔවුහු එම ප්‍රදේශවල පැරිෂ් පාසැල් ආරම්භ කොට එමඟින් අධ්‍යාපන කටයුතු ගෙන ගියහ. 1796 දී බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් අතර මුල් කාලයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ඔවුන් අවධානයක් යොමු කළ බවක් නොපෙනේ.

එසේ වුව ද ලන්දේසීන් යටතේ පැවතිව තිබූ මුහුදුබඩ ප්‍රදේශවල අභාවයට යමින් තිබූ අධ්‍යාපන කටයුතු ප්‍රතිසංවිධානය කිරීමට නෝර්ත් ආණ්ඩුකාරයා පියවර ගත් බව පෙනේ. ඔහු

- අධ්‍යාපන කටයුතු සඳහා ලන්දේසි අධ්‍යාපන ක්‍රමය පදනම වශයෙන් යොදා ගත්තේ ය.
- ක්‍රිස්තියානි ආගමික පරිසරයක් තුළ බටහිර ක්‍රමයේ අධ්‍යාපනයක් ලබා දීම ඔහුගේ අරමුණ විය.

- රජයට අවශ්‍ය ලිපිකරුවන්, මුලාදෑනීන් ආදීන් පුහුණු කිරීමට දේශීය ප්‍රභූ පන්තියේ දරුවන් සඳහා "කොළඹ ඇකඩමිය" නම් ආයතනයක් ආරම්භ කෙළේ ය. මුස්ලිම් දරුවන් සඳහා "මද්රාසා" නමින් මුස්ලිම් පාඨශාලා පිහිටුවී ය.

  1812 දී බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ලංකාවට පැමිණි පසු අධ්‍යාපනයේ සැලකිය යුතු දියුණුවක් ඇති විය. ඒ සඳහා මිෂනාරි සමාගම්වල සහාය ලැබිණි.

- ලන්ඩන් මිෂනාරි සංගමය,
- වෙස්ලියන් මෙතෝදිස්ත සංගමය,
- එංගලන්ත මිෂනාරි සමාගම,
- බැප්ටිස්ට් සමාගම,
- ඇමරිකන් මිෂනාරි සමාගම,

  යනාදි මිෂනාරි සමාගම් යටතේ අධ්‍යාපන කටයුතු ව්‍යාප්ත කෙරිණි.

- බැප්ටිස්ට් මිෂනාරි සමාගම කොළඹ මධ්‍යස්ථාන කොට ගෙන අධ්‍යාපන කටයුතු ව්‍යාප්ත කෙළේය.
- වෙස්ලියන් මෙතෝදිස්ත සමාගම උතුරු හා දකුණු ප්‍රදේශවල ව්‍යාප්ත විය.
- චර්ච් මිෂනාරි සමාගම කොළඹ, ගාල්ල, කල්පිටිය, මන්නාරම හා මහනුවර ප්‍රදේශවල ව්‍යාප්ත විය.
- ඇමරිකන් මිෂනාරි සමාගම උතුරු ප්‍රදේශයේ ඉතාමත් සංවිධානාත්මක අධ්‍යාපනයක් ගොඩනැංවී ය.
- 1833 දී කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද ප්‍රතිසංවිධාන කිහිපයක් සිදු කෙරිණි.
- ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ඇති කිරීම
- ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරීම
- ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා විද්‍යාලයක් කොළඹ පිහිටු වීම,
- ක්‍රිස්තියානි මිෂනාරි අධ්‍යාපනයට ආධාර හා අනුබල දීම, මිෂනාරි පාසල් ඇති ප්‍රදේශවල රජයේ පාසල් පිහිටු වීම ද තහනම් කිරීම යනාදිය ඒ අතර වැදගත් විය.

ඉංග්‍රීසීන් මිෂනාරි අධ්‍යාපනය කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක් වූ අතර ස්වභාෂා කෙරෙහි අවධානය යොමු නොකිරීම නිසා පසු කාලයේ ස්වභාෂා බෙහෙවින් දුර්වල තත්ත්වයට පත් විය.

1841 දී මැකන්සි ආණ්ඩුකාරයාගේ කාලයේදී ද අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදු විය.

අධ්‍යාපන කටයුතු දියුණු කිරීම සඳහා කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 සිට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ නමුත් එහි දියුණුවක් වෙනුවට දක්නට ලැබුනේ පරිහාණියකි.

මේ නිසා අධ්‍යාපන කටයුතු ප්‍රතිසංවිධානය කරන ලෙස ඉල්ලා 1865 දී දේශීය උගත්තු උද්ඝෝෂණ ව්‍යාපාර මෙහෙයවන්නට වූහ. මෙරට අධ්‍යාපනය පිළිබඳ සොයා බලා වාර්තා කිරීමට කොමිසමක් පත් කළ යුතුය යි ව්‍යවස්ථාදායක සභාවේ දේශීය නිල නොලත් මන්ත්‍රීන් වූ ජේම්ස් ද අල්විස්, මුතු කුමාරස්වාමි යන අය යෝජනා කළහ. ඒ අනුව 1865 දී ආර්. එෆ්. මෝර්ගන් මහතාගේ සභාපතිත්වය යටතේ අධ්‍යාපන කොමිසමක් පත් කරනු ලැබී ය. මෙය මෝර්ගන් කමිටුව නමින් හැඳින්විණි. මෙම කමිටුව මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි.

1865 මෝර්ගන් කමිටුවේ යෝජනා

- අධ්‍යාපනය පරිපාලනය සඳහා ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවක් පිහිටුවීම,
- අධ්‍යාපන කටයුතු පරිපාලනය රජය යටතට ගැනීම,
- මූලික අධ්‍යාපනය ස්වභාෂා මාධ්‍යයෙන් ලබාදෙන අතර ද්විතීයක හා උසස් අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් ලබාදීම,
- කාන්තා අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා බාලිකාවන්ගෙන් ගාස්තු අය නොකිරීම සහ පාසල් එන බාලිකාවන්ට තෑගි පිරිනැමීම,

  රජයේ නොවන පාසල්වලට ආධාර දීම,

  ■ කර්මාන්ත පාසල්, ■ ද්විභාෂා පාසල්, ■ මධ්‍ය පාසල්, ■ කොළඹ ඇකඩමිය ■ ගුරු පුහුණුව සඳහා පාසල් යනුවෙන් පාසල් වර්ග කිරීම යනාදිය වැදගත් ප්‍රතිසංස්කරණ කිහිපයකි.

1911 දී පත් කරන ලද කොමිසමක් මගින් යෝජනා කොට තිබූ පරිදි 1921 දී චාර්මස් ආණ්ඩුකාරයා විසින් යුනිවසිටි කොලිජිය පිහිටුවන ලදී. ලන්ඩන් විශ්ව විද්‍යාලයට සම්බන්ධ කොට මෙය පිහිටුවන ලද අතර උසස් අධ්‍යාපනය සහ ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය තවදුරටත් වැඩි දියුණු වීමට ආධාර විය.

අනතුරුව පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වූයේ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ය. මෙරට ජනයාගේ ජාතික අභිමානයට සරිලන ලෙසත් රටේ අවශ්‍යතාවලට ඉවහල් වන ලෙසත් අධ්‍යාපන සංශෝධන ඇති කළ යුතු බව එකල දේශීය නායකයන්ගේ ඉල්ලීම විය. මේ අනුව අධ්‍යාපන කටයුතු භාර විධායක කාරක සභාවේ සභාපති වූ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් මෙරට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම ආරම්භ කෙරිණි. ඔහුගේ යෝජනා පදනම්කොට සැලසුම් කරන ලද වැඩ පිළිවෙළ යටතේ අතිශය වැදගත් ප්‍රතිසංස්කරණ රාශියක් හඳුන්වා දෙන ලදී.

සියලු ම දරුවන්ට අනිවාර්ය නිදහස් අධ්‍යාපනය ලබා දීමට විධිවිධාන යොදන ලදී. ඒ අනුව සෑම දරුවකුටම බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා අධ්‍යාපනය නොමිලේ ලබා ගැනීමට අවකාශ ලැබිණි.



රූපය 2.26
සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා

1946 ජුනි මස නිදහස් අධ්‍යාපන පනත නීතිගත විය. ජාතික සංවර්ධනයට අත්‍යවශ්‍ය ප්‍රධාන පියවරක් ලෙස සැලසුම් සහගත අධ්‍යාපන ප්‍රතිපත්තියක් එමඟින් හඳුන්වා දෙන ලදී.

- ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන කුසලතා සහිත නමුත් වරප්‍රසාද නොලත් සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමට "මධ්‍ය විද්‍යාල'' ආරම්භ කරනු ලැබී ය. එහිදී කුසලතාපූර්ණ දරුවන් තෝරා ගැනීම සඳහා පහ ශ්‍රේණියේදී ශිෂ්‍යත්ව විභාගයක් පවත්වන ලදී. එයින් සමත් වූ දිළිඳු දරුවන්ට ශිෂ්‍යත්වයක් ප්‍රදානය කෙරිණි. අනතුරුව ඡන්ද කොට්ඨාස පදනම් කොට ආරම්භ කළ මධ්‍ය විද්‍යාලවලට ඔවුන් ඇතුළත් කළ අතර විශේෂයෙන් ගැහැනු දරුවන්ගේ ආරක්ෂාව සහ සියලු සිසුන්ගේ ගමන් පහසුව ආදිය සලකා එම ශිෂ්‍යත්වලාභීන්ට මධ්‍ය විද්‍යාලවල නේවාසිකාගාර පහසුකම් ලබා දෙන ලදී.
- අධ්‍යාපනය ලබා දීමේ මාධ්‍ය මව් භාෂාව විය යුතු බව පිළිගෙන එය ක්‍රියාත්මක කරනු ලැබී ය.
- පාසල් සිසුන් සඳහා දිවා ආහාර ලබාදීමේ වැඩ පිළිවෙළක් ද දියත් කෙරිණි.

නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලාංකිකයන් ලැබූ විශාල ජයග්‍රහණයක් විය. මෙම තීරණ හේතු කොට ගම්බද ප්‍රදේශ සිසාරා පාසල් පැන නැඟුණු අතර ඉදිරි කාලයේ දී රටේ උගත්තු විශාල ප්‍රමාණයක් මධ්‍ය විද්‍යාල තුළින් බිහි වූහ.

- සියලු දරුවන්ට සමාන අධ්‍යාපන අවස්ථා ලබා දිය යුතු බවත් ඒ සඳහා සියලු පාසල්වල පහසුකම් වැඩි දියුණු කළ යුතු බවත් පිළිගනු ලැබී ය.
- දෙවන බස ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම අනිවාර්ය කෙළේ ය.
- පාසල තුළ ආගම අනිවාර්ය විෂයයක් බවට පත් කරනු ලැබී ය.
- ගුරු පුහුණුව සඳහා විශේෂ ආයතන පිහිටුවී ය. ගුරුවරුන්ට දෙපාර්තමේන්තුව මඟින් කෙලින්ම වැටුප් ගෙවීමේ ක්‍රමයක් ආරම්භ කෙළේ ය.

මෙම යෝජනා අනුව පාසල් කාලය අවසන් වත් ම උසස් අධ්‍යාපනයක් හෝ වෘත්තීය අධ්‍යාපනයක් හෝ ලබා පාසලින් පිට වූ ශිෂ්‍යයන්ට රටේ අවශ්‍යතා අනුව රැකියා අවස්ථා සැපයීම මෙම යෝජනාවල අරමුණ විය.

කන්නන්ගර මහතා "නිදහස් අධ්‍යාපනයේ පියා" යන විරුදාවලියෙන් පිදුම් ලබා ඇත.

## ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- 1812 - 1931 දක්වා බ්‍රිතාන්‍ය පාලනය යටතේ අධ්‍යාපනයේ වර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග පෙළ ගස්වන්න.
- නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස හැඳින්වෙන සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාගෙන් මෙරට අධ්‍යාපනයේ දියුණුවට ඉටු වූ සේවය පිළිබඳව පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

බ්‍රිතාන්‍ය යටත් විජිත සමය තුළ මෙරට විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් කිහිපයක් පහත දැක් වේ.

- දීර්ඝ කාලයක් තිස්සේ නොසලකා හැර තිබූ පැරණි වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව බ්‍රිතාන්‍යයන් විසින් හඳුනා ගැනීම සහ ඇතැම් ආණ්ඩුකාරවරු ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගත්හ. එහෙත් ඒවා සාර්ථක නොවී ය.
- මිෂනාරීන් මඟින් ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම සිදු විය.
- ස්වභාෂා අධ්‍යාපනය නොසලකා හැරීම බ්‍රිතාන්‍ය පාලනය යටතේ දක්නට ලැබුන ප්‍රධාන ලක්ෂණයකි.
- අධ්‍යාපනය අනිවාර්ය කෙරිණි.
- තැපැල් සේවා, විදුලි පණිවුඩ ක්‍රමය සහ බැංකු සේවා වැනි නූතන සන්නිවේදන ක්‍රම සහ ගනුදෙනු ක්‍රම ආරම්භ විය.
- මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීම, වරායයන් වැඩි දියුණු කිරීම පරිවහන ක්ෂේත්‍රයේ දියුණුව පැහැදිලි කෙරේ.
- ගොවිතැන් කටයුතු නොසලකා හැර වෙළෙඳ බෝග වගාව ආර්ථික ක්‍රමයේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් කෙරිණි.
- ආනයන අපනයන වෙළෙඳාම මත රටේ ආර්ථිකය හැඩ ගැසීම නිසා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළෙඳපොලට විවෘත විය.
- මෙරට ආර්ථිකය ලෝක වෙළෙඳපොල මත යැපෙන තත්ත්වයකට පත් කෙරිණි.
- රටේ ජනතාවට අයිතිවීමට තිබූ ඉඩම් විදේශිය පුද්ගලික ව්‍යවසායකයන්ට ලබාදීම නිසා මේ රටේ බිම් අඟලකට හිමිකම් නොමැති දුගී දුප්පත් ජනකොටසක් බිහි විය.

- රටේ සම්පත්වලට පරිසරයට හා අවශ්‍යතාවලට සරිලන පරිදි සියවස් විස්සක වැඩි කාලයක් තිස්සේ ගොඩ නැඟී තිබූ නිදහස් සහ නිවහල් දේශපාලන, ආර්ථික, සමාජ සංස්කෘතික ලක්ෂණවලින් හෙබි ජාතික උරුමය විනාශ කිරීමට මඟ විවෘත කළ බ්‍රිතාන්‍ය යටත් විජිත සමය තුළ මෙරට විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් කිහිපයක් පහත දැක් වේ.
- විදේශයන්ට ගැති යටත් විජිත මානසිකත්වයකින් යුක්ත බටහිර ඌරුවට හැඩගැසුන සභ්‍යත්වයක් මෙරට රෝපණය කිරීම,
- මුදල් පරිහරණය හඳුන්වා දීම සහ එමඟින් මුදල්වලට ප්‍රමුඛස්ථානය ලබා දුන්නා වූ සමාජයක් ගොඩ නැංවීම,
- කෙසේ හෝ මුදල් හරි හම්බ කර ගැනීම සඳහා තරග වැදීමට ජනතාව පුරුදු පුහුණු කිරීම,
- මේ රටට උරුමව පැවති අන්‍යොන්‍ය සහයෝගයෙන් පිරුණු සාමකාමී සහජීවනය ප්‍රධාන කොට ගත් සාරධර්මවලින් හෙබි සමාජ ක්‍රමය මුළුමනින් ම විනාශ කොට දැමීම,
- සියලු අංශවලින් රටේ ඉදිරි ගමන අඩාල වීමත්, ආර්ථිකය දියුණු නොවීමත් නිසා නිදහස ලැබීමෙන් පසුව පවා අධිරාජ්‍යවාදී ග්‍රහණයන්ට හසුවී සිටීමට බල කෙරෙන තත්ත්වයක් ගොඩ නැඟීම යනාදිය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් මෙරටට උරුම කර දුන් අහිතකර දායාද විය.

**සාරාංශය**

- 1796 බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඇඳා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්ති
- චිරාගත සම්ප්‍රදායයක් ව පැවති රාජකාරි ක්‍රමය පියවරෙන් පියවර අවලංගු කිරීම
- වතු වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය
- දේශීය ජනතාව නවීකරණය හා බටහිරකරණයට හුරුවීම
- මධ්‍යම පංතියේ වර්ධනය සහ ඔවුන්ගේ ක්‍රියාමාර්ග
- ජාතික ව්‍යාපාරයේ ස්වභාවය
- බ්‍රිතාන්‍යයන් යටතේ අධ්‍යාපන කටයුතු
- ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය